www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ් හා භූටෝ පකිස්ථානයේ ව්‍යාජ ජනාධිපතිවරනයේ හවුල්කරුවෝ වෙති

## Bush, Bhutto accomplices in Pakistan's sham presidential election

**කීත් ජෝන්ස් විසිනි**
**2007 ඔක්තෝබර් 6**

පකිස්ථානයේ මිලිටරි පාලන තන්ත්‍රය ඔක්තෝබර් 5 පැවැත්වූ ව්‍යාජ ජනාධිපතිවරනයට අනුමැතිය පලකරන තාවකාලිකව මුද්‍රාවක් තබමින් එරට ශ්‍රේෂ්ඨාධිකරනය එදින තීන්දුවක් නිකුත් කල අතර එහි අරමුන ජෙනරාල් පර්වේස් මුෂාරෆ් 2012 වසර අවසානය තෙක් පකිස්ථානයේ ජනාධිපති ලෙස පත්කිරීම ය.

ව්‍යවස්ථාවේ හරය හා අධිකාරය යන දෙක ම පැහැදිලි ලෙස උල්ලංඝනය කල මැතිවරන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාහැකි බව නියෝග කල අධිකරනය, මුෂාරෆ් ජනාධිපති අපේක්ෂකයෙක් වීමට සුදුසුකම් ලබා ඇත්ද යන්න විනිශ්චය කිරීම කල්දැමූ අතර මැතිවරන කොමිසමට උපදෙස් දුන්නේ ප්‍රශ්නය පිලිබඳව අධිකරනයේ තීරනය ලැබෙන තෙක් මුෂාරෆ් තේරී පත්වූ බව ප්‍රකාශයට පත් නොකරන ලෙස ය.

විනිශ්චයකාර ජාවෙඩ් ඉක්බාල් නිවේදනය කලේ "මැතිවරන ක්‍රියාවලිය ඉදිරියට යා යුතු බවට විනිශ්චය මන්ඩලය ඒකමතිකව තීරනය කර උපදෙස් දී ඇති" බව ය. එහෙත් තේරී පත් වන අපේක්ෂකයා පිලිබඳ අවසාන නිවේදනය මෙම ප්‍රශ්නය පිලිබඳ පෙත්සම විභාගයට ගන්නා ඔක්තෝබර් 17 දින වනතාක් නිකුත් නොකරනු ඇත."

1999 ඔක්තෝබරයේ දී මිලිටරි කුමන්ත්‍රනයකින් බලය අල්ලා ගත් මුෂාරෆ්, ඇෆ්ගනිස්ථානයේ හා ඉරාකයේ ගෙන ගිය සිය ආක්‍රමනකාරී යුද්ධයන් හි දී බුෂ් පරිපාලනයේ ප්‍රමුඛ හා මහත් ප්‍රසංශාවට ලක් වූ පුද්ගලයා ද විය. අධිකරන නියෝගය ඔහුට පසුබෑමක් විය.

පකිස්ථානයේ ජනාධිපති හා ආරක්ෂක සේවයේ ප්‍රධානියා, මිලිටරි පාලනයට සහාය දැක් වීමේ දිගු හා නින්දිත වාර්තාවකට හිමිකම් කියන පකිස්ථාන අධිකරනයෙන් ඔක්තෝබර් 6වැනි දින රජය මෙහෙය වූ ජනාධිපතිවරනය මෙන් ම ඔහුගේ අපේක්ෂකත්වය අනුමත කරන මුද්‍රාවක් තබනු ඇතැයි බලාපොරොත්තු විය.

ඒ කෙසේ වෙතත් 5 දින තීන්දුවත් සැලකිය යුතු ඉස්පාසුවක් ලබා ගැනීමට මුෂාරෆ්ට හැකි විය. මිලිටරි ආන්ඩුව මගින් නියම කල කාල සටහනකට හා පිලිකුල් සහගත ලෙස ව්‍යවස්ථා විරෝධී ආකාරයකට ගෙන ගිය නිසා ම ව්‍යාජ මැතිවරනයක් ජනාධිපතිවරනයට, කිසි සේත් ම නොලැබිය යුතු නීත්‍යානුකූලභාවයක් එමගින් ලබා දී තිබේ. මේ අතර නීතිපති, තාවකාලික ප්‍රතිඵල නිකුත් කිරීමේ දී මැතිවරන කොමිසමට අවහිර කෙරෙන කිසිවක් සිදු නොවන බවට වගබලාගෙන ඇත.

එහි අවසාන තීන්දුව ප්‍රකාශ කරන තාක් මැතිවරනය ප්‍රමාද කල යුතු යයි නියෝග කලේ නම්, පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයට, වයඹදිග දේශසීමා ප්‍රාන්තයේ ව්‍යවස්ථාදායකය විසිරුවා හැරීමට බල කරන එහි තර්ජනය එල දැරීමට ඉඩ තිබුනි. ඒ අනුව මැතිවරනයේ නීති විරෝධී හා අසම්මතභාවය තව දුරටත් ඉස්මතු කෙරෙනු ඇත. (මුෂාරෆ්ගේ ඒකාධිපති පාලනය තුල බෙහෙවින් ශක්තිමත් කල බලතල සහිත ජනාධිපති, පකිස්ථාන ව්‍යවස්ථාව යටතේ පත් කර ගන්නේ වක්‍ර ආකාරයෙනි. එනම් පලාත් හතරේ පාර්ලිමේන්තුවල හා දැනට සිටින ජාතික සාමාජිකයන්ගෙන් සැදුම් ලත් මැතිවරන විද්‍යාලය මගිනි.)

පසු ගිය මස අවසානයේ දී, මුෂාරෆ්ගේ අපේක්ෂකත්වය හා මැතිවරනයේ ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කල කිහිප වතාවක දී ඊට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරනයේ වෙනස් විනිශ්චය මන්ඩලයකින් තීන්දු ප්‍රකාශ කල අතර ඒවා පරදුවට තැබුනු ව්‍යවස්ථාදායක ගැටලු පිලිබඳ නිශ්චිත භාවයකින් තොර විය. පෙත්සම් ඉදිරිපත් කල අයට ඒ සඳහා නීත්‍යානුකූල අයිතියක් නොතිබීම හෝ ඒ සඳහා සුදුසු කාලය එලඹ නොතිබීම වැනි තාක්ෂනික හේතු මත එම අභියෝගයන් අධිකරනය මගින් ප්‍රතික්ෂේප කල බව කිව යුතු ය. හොර ඡන්ද දැමීම හා මිලිටරියේ අධීක්ෂනය මගින් දූෂිත වූ වසර පහකට පෙර පැවති මැතිවරනවලින් පත් කර ගත්, පවතින ජාතික හා ප්‍රාන්ත පාර්ලිමේන්තුවලට 2012 දක්වා පකිස්ථානයේ ජනාධිපති

තෝරා ගැනීමේ නීත්‍යානුකූල බලයක් තිබේ ද යන්න හෝ මිලිටරියේ සාමාජිකයන්ට දේශපාලනය කිරීම තහනම් කරන ව්‍යවස්ථා රෙගුලාසි තිබිය දීත් මුෂාරෆ්ට ජනාධිපති ලෙස මැතිවරනයට ඉදිරිපත් විය හැකි ද යන්න ගැන එය එක එල්ලේ තීන්දුවක් පලකොට නැත. එමෙන් ම දෙවැනි විධිවිධානය එනම් තෝරා පත් කර නොගත්, ආන්ඩුවේ රැකියාවන්හි නියුතු වූවන් විශ්‍රාමගෙන දෙවසරක් යන තෙක් මැතිවරනවලට ඉදිරිපත් වීම තහනම් කරන රෙගුලාසි (මැතිවරන කොමිසම විසින් මෑතක දී එම රෙගුලාසි බල රහිත බව ප්‍රකාශ කර තිබේ.) පිලිබඳව ද පැහැදිලි තීන්දුවක් දී නැත.

පකිස්ථානයේ ශ්‍රේෂ්ඨාධිකරනය සමස්තයක් ලෙස ගත් විට එහි පාලක පැලැන්තිය සේ ම, තවත් පස් වසරකට ජනාධිපති තනතුර රැකගැනීම හා රටේ දේශපාලන හා ආර්ථික ජීවිතය තුල මිලිටරියේ අධිකාරී ක්‍රියා කලාපය චිරස්ථායී කර ගැනීමේ, ව්‍යාපෘතිය මත බෙහෙවින් භේද භින්න වීමට බොහෝසෙයින් ඉඩ තිබේ.

මුෂාරෆ්ගේ අපේක්ෂකත්වය හා ජනාධිපතිවරනයේ ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කල පෙත්සම්වලට එරෙහිව දුන් තීන්දුවේ දී හිටපු ශ්‍රේෂ්ඨාධිකරන විනිසුරු මඬුල්ල 6ට 3ක් ලෙස බෙදී ගියේ ය.

ජනාධිපතිවරනය පිලිබඳ ව්‍යවස්ථාමය අභියෝගයන් ගැන අධිකරනයේ තීන්දුව ඔක්තෝබර් 17 වැනි දින ප්‍රකාශයට පත් කිරීමට නියමිත අතර එය අතිශයින් වැදගත් වන්නා සේ ම තීන්දුවේ නිශ්චිත භාවයක් නොතිබීමට හේතු විය හැකි සැඟවුනු අරමුනක් පවතින බව ද තරයේ ම ප්‍රකාශ කල යුතු ය. එනම් හිටපු අගමැතිවරියක් ද ජීවිතාන්තය දක්වා පකිස්ථානු මහජන පක්ෂයේ සභාපති ද වන බෙනාසීර් භූටෝ දැන් වොෂින්ටනයේ කැමැත්ත දිනාගෙන සිටින අතර ඇය සමඟ දේශපාලන හවුල සමාප්තියකට ගෙන ඒම පිනිස ජෙනරාල්-ජනාධිපති පොලඹවාලීමයි.

තමන් ම පනවාගත් පිටුවහලේ වසර අටක කාලය අවසන් කරමින් භූටෝ පකිස්ථානයට පැමිනීමට යොදා ගෙන ඇත්තේ ඔක්තෝබර් 17 දින ය.

බුෂ් පාලනාධිකාරයේ දැඩි බලපෑම යටතේ හා ඊට අඩු තරමින් ගෝර්ඩන් බ්‍රවුන්ගේ බ්‍රිතාන්‍ය ආන්ඩුවේ බලපෑම හමුවේ භූටෝ හා මුෂාරෆ් යලි එකමුතු වීමක් සඳහා සාකච්ඡා පවත්වා තිබේ. අවම වසයෙන් පසුගිය ශරත් සමය සිට පැවති සාකච්ඡාවන්ට අනුව මුෂාරෆ් ජනාධිපති තනතුර හිමි කර ගන්නා අතර භූටෝ ඔහුගේ අගමැති වීමට නියමිත ය.

කෙසේ වුවද, එකඟත්වයකට පැමිනීම බෙහෙවින් ගැටලු සහගත වී තිබේ. ඒ සැබෑ බලය බෙදා ගැනීමකට මුෂාරෆ් ලෝභකම් දැක්වීම නිසා පමනක් නො වේ. මිලිටරියේ පිටුබලය සපයන ඔහුගේ පාර්ලිමේන්තු සගයන් එවැන්නක ප්‍රතිඵලය තමන්ගේ කොන්වීම බව දන්නා බැවින් පකිස්ථාන ජනතා පක්ෂය (පීපීපී) සමඟ මොනම බලය බෙදාගැනීමකට හෝ තරයේ ම විරෝධය දක්වා ඇත. මිලිටරිය සිය පාර්ශ්වයෙන් හවුලට එක් ව ඇත්තේ දැවැන්ත මිලිටරි වැය ශීර්ෂය හා "ජාතික ආරක්ෂාව" පිලිබඳ කාරනාවල දී තීරනාත්මක සාධකය බවට තමන් පත්වීමේ තැන රැකගැනීම සඳහා පමනක් නොව හමුදා නිලධරය මතත් ධනය හා ආර්ථික බලය රැකගැනීම සඳහාත් ය.

මේ අතර භූටෝ ඒත්තුගෙන ඇත්තේ මුෂාරෆ් පාලන තන්ත්‍රය කෙරෙහි එන්ට එන්ටම දැඩිව නැගී එන මහජන විරෝධය හමුවේ සාකච්ඡාවල දී සිය අත ශක්තිමත් වී ඇති බවයි. පසු ගිය මාර්තුවේ දී අග්‍රවිනිශ්චයකරු බලයෙන් පහ කිරීමට දැරූ අසාර්ථක උත්සාහයන් මැයි 12-13 කරච්චි නුවර සිදු වූ ලේ ස්නානය ඇතුලු විරෝධතාවන්, විවිධාකාර දුබල ක්‍රමවේදයන් මගින් මැඩීමට ආන්ඩුව අපොහොසත්ව සිටී.

එහෙත් භූටෝ ඇතුලු පීපීපී නායකත්වය, මුෂාරෆ් කෙරෙහි වන මහජන විරෝධය තමන්ට දෙපැත්ත කැපෙන කඩුවක් වන බව වටහා ගෙන සිටියි. මුෂාරෆ් සමග පෙල ගැසීම මගින් පීපීපී ය, ප්‍රජාතන්ත්‍රවාදයේ හා ප්‍රගතිශීලී පරිවර්තනයේ සටන්කරුවෙක් ය යන එහි පුරසාරම, සාමාන්‍ය පකිස්ථානුවන්ගේ ඇස්පනාපිට ඇත්ත අප කීර්තියට පත්විය හැකි ය.

මෙම සතියේ දී මුෂාරෆ් හා ඔහුගේ හෙන්චයියන් ද භූටෝ හා ඇගේ පීපීපී ය, ජනාධිපතිවරනයේ ප්‍රතිඵල හා එහි ව්‍යවස්ථානුකූල භාවය පිලිබඳ ලැබීමට නිමිත උසාවි නියෝගය, බලය බෙදාගැනීමේ සාකච්ඡාවල දී උපරිම ලීවරයක් ලෙස යොදාගැනීමට උත්සාහ කලහ.

සතිය ආරම්භයේ දී, මුෂාරෆ් හෙලිදරව් කලේ, තමන් ජනාධිපති ලෙස තේරී පත් වුව හොත් එදින සිට රටේ බලගතුම රහස් ඔත්තු සේවය වන අයිඑස්අයි හි හිටපු ප්‍රධානියා වූ ජෙනරාල් අසාක් පර්වේස් ඛාන් තමන්ගේ තැනට පත්වනු ඇති බවයි.

මාධ්‍ය වාර්තාවලට අනුව, ජෙනරාල් ඛාන් මුෂාරෆ් සමග භූටෝ හමුවීමට පසුගිය ජූලි මාසයේ දී ඩුබායි බලා පියාසර කල අතර ඇය සමග සාකච්ඡාවල දී ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටු කලේය.

ඔක්තෝබර් 3 දින භූටෝ ප්‍රකාශ කලේ මුෂාරෆ් සමග සාකච්ඡා "මුලුමනින්ම ඇනහිට" ඇති බව ය. පීපීපීයේ මන්ත්‍රීවරුන්ට සිය ආසනවලින් ඉල්ලා අස්වීමට උපදෙස් දෙන බවට ද ඇය තර්ජනය කලා ය. "

පකිස්ථාන මහජන පක්ෂ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලා අස් වීම මැතිවරනයේ නීත්‍යානුකූල භාවයට මරු පහරක් වනු ඇතැයි" ඇය සෝරනාඩු කලාය.

සතිය මුල දී මුෂාරෆ්ට හා මිලිටරි පාලනයට එරෙහි පීපීපී හි අතිජාත සගයන් වන නවාස් ෂරීෆ්ගේ පීඑම්එල් (එන්) හි පාර්ලිමේන්තු මන්ත්‍රීන් හා ඉස්ලාමීය පක්ෂ සන්ධානය වන එම්එම්ඒ හි මන්ත්‍රීන් විශාල සංඛ්‍යාවක්, එලඹෙන ව්‍යාජ ජනාධිපතිවරනයට විරෝධය දක්වමින් ඔවුන්ගේ ආසනවලින් ඉවත්වූහ.

එහෙත් ඔක්තෝබර් 5 දින වනවිට භූටෝ බෙහෙවින් වෙනස්වූ තාලයකට ගායනය පටන්ගෙන තිබුනි. ඇය ලන්ඩන්හි පැවති සෙනග පිරුනු මාධ්‍ය හමුවකදී කියාසිටියේ මුෂාරෆ් සමග බලය බෙදාගැනීමේ ගිවිසුමක් අනිවාර්ය බවත්, පීපීපී මන්ත්‍රීවරුන්ට 6 වැනි දින රැවටිලිකාර මැතිවරනයට සහභාගි වීමට උපදෙස් දෙන බවත් ය.

භූටෝට අනුව පීපීපීය, ජෙනරාල් නිල ඇඳුමෙන් සිටින තාක් කල් මුෂාරෆ්ට ඡන්දය නොදෙනු ඇති නමුත්, අගවා සිටියේ පීපීපීය අනාගතයේ දී සිවිල් ජනාධිපතිවරයෙක් ලෙස ඔහුට විශ්වාසය පල කරන නොබැඳුනු ඡන්දයක් දිය හැකි බවත් ය. පීපීපී මන්ත්‍රීන් එක්කෝ ඡන්දය දීමෙන් වැලකී සිටිනු හෝ පීපීපීයේ ජනාධිපති අපේක්ෂකයා ලෙස පත් කොට ඇති උප ජනාධිපතිට ඡන්දය දෙනු ඇත. එහෙත් 6 වැනි දින මැතිවරනයේ දී මුෂාරෆ්ට පීපීපීයේ ඡන්ද අවශ්‍යවන්නේ නැත. ඔහුට පහසුවෙන් ජය ගැනීම සඳහා මිලිටරි අනුග්‍රහය ලබන පීඑම්එල් (කිව්) හා කරච්චිය පදනම් කරගත් එම්කිව්එච් හි ඡන්ද සෑහෙන්නේය. එහෙත් නිසැකව ම ඔහුට, ව්‍යාජ මැතිවරනයට නීති යුක්ත භාවයක් ආරෝපනය කිරීමට නම් පීපීපීය නයට ගැනීම අවශ්‍ය කෙරේ.

ඔක්තෝබර් 5 වැනි දින සවස මුෂාරෆ්, 1988 හා 1999 ඔක්තෝබර් 12 දින දක්වා තිලතල දැරූ සියලු දේශපාලඥයන් ට හා නිලධරයන්ට, කිසිදු අපරාධයකට චෝදනා නොකර සමාව දෙන "ජාතික ප්‍රතිසන්ධානයේ ආඥාපනත" නීතියක් බවට පත් කරමින් විධිමත් ලෙස සිය අත්සන යෙදී ය. භූටෝ මුෂාරෆ් සමග ඕනෑම ගිවිසුමකදී ඇයට එරෙහි දූෂන චෝදනා හා අනෙකුත් පීපීපී නායකයන්ට එරෙහි විවිධ අපරාධ චෝදනා ඉවත දැමීම කොන්දේසියක් කර ගෙන තිබුනේ ය.

සමාව නවාස් ෂරීෆ්ට වලංගුවන බවක් නොපෙනේ. මිලිටරි තන්ත්‍රය විසින් විවිධ වැරදි මත පසුකාලයක දී චෝදනාවට ලක් කල නවාස් ෂරීෆ්, මුෂාරෆ් විසින් අගමැතිකමින් පහකර තිබුනි.

මෙම සතියේ සාකච්ඡාවල දී වොෂින්ටනය ක්‍රියා කලාපයක් ඉටු කල බව භූටෝ මෙන් ම මුෂාරෆ්ද පිලිගෙන ඇත. යථාර්ථය නම් භූටෝ-මුෂාරෆ් ගිවිසුම, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ සාපරාධී කුමන්ත්‍රනයක ප්‍රතිඵලය බවයි. ප්‍රජාතන්ත්‍රවාදය කරා මාවතකට බෙහෙවින් වෙනස් ලෙස එහි අර්ථය වනුයේ කලාපයෙහි කොල්ලකාරී එක්සත් ජනපද අවශ්‍යතාවන් සුරැකීමත්, රට තුල වොෂින්ටනයේ ප්‍රධාන සගයා වන මිලිටරියේ අධිකාරී බලය ආරක්ෂා කිරීමත් ය.

මෑත සතිවල දී බුෂ් පාලනාධිකාරයේ නිලධාරින්, මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සාහසික ලෙස උල්ලංඝනය කිරීම පිලිබඳව මුෂාරෆ් තන්ත්‍රයට හොඳින් තෝරා ගත් විවේචන එල්ල කලේ භූටෝ සමග හවුල් කාරිත්වයකට මුෂාරෆ්ගේ තල්ලු කිරීමේ අරමුන ඇතිව ය. එනමුදු වොෂින්ටනය, සැප්තැම්බර් මුල දී පකිස්ථානයට යලි පැමිනීමේ උත්සාහයේ දී ෂරීෆ් අත් අඩංගුවට ගැනීමට දහස් ගනනක් ආරක්ෂක හමුදාවන් මෙහෙයවූ කල, මිලිටරි තන්ත්‍රය විවේචනය කලේ නැත. ඉන් පසු ෂරීෆ් පිටුවහල් කරනු ලැබිනි. එය, 6වැනි දින නිදහස් හා සාධාරන බවේ ප්‍රතිවාදය වූ ව්‍යාජ මැතිවරනය විවේචනය කලේ ද නැත.

© www.wsws.org